F - 10

# ආර්ථික සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රීය විග්‍රහය සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන අවධිය

පියදස හේවගේ,
(භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලයීය විද්‍යායතනය, මාතර)

ආර්ථික සංවර්ධන සංකල්පය ගතවූ දශක තුන තුළදී, විෂයය ක්ෂේත්‍ර රාශියක විමර්ශණයට භාජනය විය. මේ පිළිබඳව වූ විවිධ මත වලින්, ආර්ථික සංවර්ධනයෙහි ක්ෂේත්‍රීය මුහුණුවර ගැනද නිගමණ ප්‍රකාශ විය. ආර්ථික වශයෙන් සංවර්ධනය වූ ප්‍රදේශ හා එසේ නොවූ ප්‍රදේශ පිළිබඳ ද්විත්වය අද පවා නව අදහස්වලින් පෝෂණය වෙයි.

මෙම ලිපියෙහි අරමුණ වන්නේ ආර්ථික සංවර්ධනයෙහි ක්ෂේත්‍රීය මුහුණුවර සැලකිල්ලට ගනිමින් එය හඳුනා ගැනීමට යත්න දැරීමයි. ලිපිය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය. එහි පළමුවන කොටසෙන්, ආර්ථික සංවර්ධනයෙහි ක්ෂේත්‍රීය විග්‍රහය ආදර්ශකයක් ඇසුරෙන් සාකච්ඡා කරනු ලැබේ. එම ආදර්ශකය පදනම් කොට ගෙන ශ්‍රී ලංකාවෙහි වර්තමාන සංවර්ධන අවධිය හඳුනාගැනීම ලිපියෙහි දෙවන කොටසට අයත් වෙයි. ශ්‍රී ලංකාවෙහි තෝරාගත් සාධකවල දිගුකාලීන උපනතියෙන් හෙළිවන නිගමණ මෙම දෙවන කොටසට ඇතුළත් කෙරේ.

ආර්ථික සංවර්ධනය ගතික ක්‍රියාවලියක් ලෙස සැලකිල්ලට ගන්නා විට, කාලය එහි වැදගත් අවධි පෙන්වා දෙයි. එමෙන්ම ආර්ථික සංවර්ධනයෙහි ක්ෂේත්‍රීය ලක්ෂණ විමසීමේදී, ප්‍රාදේශීයව බිහිවන විවිධත්වය පිළිගත හැකිය. මෙම විවිධත්වය කාලයට සාපේක්ෂව වෙනස්වනු ඇත. මේ අනුව ආර්ථික සංවර්ධනය කාලය සහ ක්ෂේත්‍රය යන ද්විමානයෙන් නිරූපණය කෙරෙන චිත්‍රයකි. එක් අවස්ථාවකදී අපට හඳුනාගත හැකි වන්නේ නිරන්තරයෙන් වෙනස්වන මෙම චිත්‍රයෙහි කොටසකි. ආර්ථික සංවර්ධනය නිරන්තරයෙන් වෙනස් වන්නේ වුවද එහි ප්‍රමුඛ අවධි කිහිපයක් හඳුනා ගැනීම අපහසු නොවේ. විශේෂයෙන් දියුණුවන රටවල වර්තමාන ලක්ෂණ විමසීමෙන් පැහැදිලි වන්නේ මෙම අවධිමය ස්වරූපයයි.

ඉතාම මෑතදී, ආර්ථික සංවර්ධනය ක්ෂේත්‍රීයව සහ කාලීනව ගොඩනැගෙන ආකාරය, චතුර් අවධි ආදර්ශකයක් මගින් පැහැදිලි කරනු ලැබීය. ආසියානු සහ අප්‍රිකානු යටත් විජිත ලෙස පැවැති රටවල තොරතුරු ඇසුරෙන් එඩ්වර්ඩ් ටෆ්ෆ් මෙම ආදර්ශකය ඉදිරිපත් කරන ලදී. පසුව පීටර් ගෝල්ඩ්, ආර්. මෝරිල් සහ පීටර් හැගට් යන අය ආදර්ශකය පිළිබඳව වටිනා අදහස් ද දෘශ්‍යමාන නිරීක්ෂණද රාශියක් ඉදිරිපත් කරන ලදී. ආචාර්ය පී. සී. එච්. රණසිංහ (1972), ආදර්ශකය ශ්‍රී ලංකාවේ නියෝජනය වන ආකාරය සැලැකිල්ලට ගෙන තිබේ.

ආදර්ශකය ශ්‍රී ලංකාවේ නියෝජනය වන ආකාරය පරීක්ෂා කිරීම සඳහා පහත සඳහන් දිගු කාලීන සාධක සැලකිල්ලට ගන්නා ලදී.

1. මුළු ජනගහන සංඛ්‍යාව — ජන සංඛ්‍යාව වර්ධනය වූ ආකාරය.
2. මහාමාර්ග පරිවහන ජාලය — සබැඳුම වර්ධනය වූ ආකාරය.
3. නාගරීකරණය — නාගරික කේන්ද්‍රස්ථාන ගණන සහ නාගරික ජන සංඛ්‍යාව වර්ධනය වූ ආකාරය.

ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන අවධිය, ආදර්ශකයෙහි දෙවන සහ තෙවන සංවර්ධන අවධි අතර 'අන්තර් අවධිය' හා අනුරූප වන බව පෙනේ.